# (එ) සේවා නියුක්තිය සහ කම්කරු සම්බන්ධතා

## 1. හැඳින්වීම

සංගණන වර්ෂය හෝ සේවා නියුක්තිය පිළිබඳව සමීක්ෂණයන් පැවැත්වූ ඇතැම් වර්ෂ හැරුණුකොට, අනෙකුත් කාල සීමාවන් පිළිබඳව සේවා නියුක්ති හා වියුක්ති සංඛ්‍යා ලබාගත නොහැකි බව පසුගිය වාර්ෂික වාර්තා වල පෙන්නුම් කර ඇත. 1971, සංගණන වර්ෂයක් වුවද, විශ්ලේෂණය සඳහා අවශ්‍ය සංඛ්‍යාවන් ලබා ගැනීමට තවත් කල් ගත විය හැකිය. දැනට ලබාගත හැකි තරමක සම්බන්ධයක් ඇති සංඛ්‍යා වනුයේ රැකියා සහ වඩා යහපත් රැකියා අපේක්ෂාවෙන් රැකියා කාර්යාලවල ලියාපදිංචිවූවන්ගේ සංඛ්‍යාවන්ය. මුළු එකතුව ගණන් ගැනීමෙහිලා සතුටුදායක නොවුවද, මේවා උපනතිය පුළුල් වශයෙන් පෙන්වයි.

මෙම සංඛ්‍යාවන්ට අතිරේක වශයෙන් මහ බැංකුව විසින් පොදු අංශයේ සේවා නියුක්තිය සම්බන්ධව වාර්ෂිකව පරීක්ෂණයක් පවත්වනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල (සේ. අ. අ.) යටතේ ලියාපදිංචි ඇති සේවකයින් සම්බන්ධව තොරතුරුද, මහ බැංකුව ලබා ගනියි. මෙසේ ලබාගත හැකි, අළුත්ම දත්තයන් ඇත්තේ 1970 වසර සඳහාය. අනුමත කළ පෞද්ගලික අර්ථසාධක අරමුදල් (අ. පෞ. අ. අ.) ගණනාවක්ද ඇති බැවින්, සේ අ. අ. සංඛ්‍යාවන් අංග සම්පූර්ණ නොවේ. අදාළ සේවා නියුක්ති සංඛ්‍යාවන් සපයන ලෙස මෙම අරමුදල් වලින් ඉල්ලා, සංඛ්‍යාවල පරිපූර්ණභාවයක් ඇති කර ගැනීමට උත්සාහයක් දැරිණි.

1969 නොවැම්බර් මස 1 වැනි දයින් ඇරඹුන මාස දෙක සඳහා සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ලංකාවේ සමාජීය ආර්ථික සමීක්ෂණයක් පැවැත්විණ. මෙම සමීක්ෂණය අනුව සේවයේ නියුක්ත වූවන් 3,518,000 ක් වූ අතර, 557,000 ක් සේවා වියුක්ත වූවන් බව පෙනිණි. මේ අනුව මුළු ශ්‍රම බලවේගයෙන් සියයට 14 ක ප්‍රමාණයක් සේවා වියුක්ති සංඛ්‍යාවේ අන්තර්ගත වෙයි.

## 2. රැකියා ලබා දෙනු ලැබූ සංඛ්‍යාව

1960 සිට 1971 දක්වා රැකිරක්ෂා කාර්යාල මගින් වාර්ෂික වශයෙන් රැකියා ලබාදුන් අයගේ සංඛ්‍යාව ii (එ) 1 වැනි සංඛ්‍යා සටහනේ දක්වේ. 1971 වසරේදී රැකිරක්ෂා කාර්යාල මගින් රැකියාවන් ලබාදෙනු ලැබූ පුද්ගලයින්ගේ මුළු සංඛ්‍යාව 3,556 කි. රැකිරක්ෂා කාර්යාල විසින් සියළුම වර්ගවලට අයත් සේවකයන් සඳහා රැකියා ලබාදුන් අයගේ සංඛ්‍යාව ඉකුත් වර්ෂයට වඩා මේ වසරේ වැඩිවූයේවී නමුත්, ප්‍රතිශතයක් වශයෙන් රැකියා ලබාදුන් අයගේ මුළු සංඛ්‍යාව වැඩිවූයේ 0.1 කින් පමණකි.

### II (එ) 1 වන සංඛ්‍යා සටහන

**රැකියා ලබා දෙනු ලැබූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව සහ එක් එක් වර්ග යටතේ, ලියාපදිංචි වී ඇති මුළු සංඛ්‍යාවට එහි ඇති සාපේක්ෂ වැදගත්කම**

| වර්ෂය | කාර්මික සහ ලිපිකරු | | පුහුණු | | අර්ධ - පුහුණු | | නුපුහුණු | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රැකියා ලබාදුන් සංඛ්‍යාව | එම වර්ගය යටතේ ලියාපදිංචි වූවන්ගෙන් ප්‍රතිශතයක් ලෙස | රැකියා ලබාදුන් සංඛ්‍යාව | එම වර්ගය යටතේ ලියාපදිංචි වූවන්ගෙන් ප්‍රතිශතයක් ලෙස | රැකියා ලබාදුන් සංඛ්‍යාව | එම වර්ගය යටතේ ලියාපදිංචි වූවන්ගෙන් ප්‍රතිශතයක් ලෙස | රැකියා ලබාදුන් සංඛ්‍යාව | එම වර්ගය යටතේ ලියාපදිංචි වූවන්ගෙන් ප්‍රතිශතයක් ලෙස | රැකියා ලබාදුන් සංඛ්‍යාව | ලියාපදිංචි වූවන්ගෙන් ප්‍රතිශතයක් ලෙස |
| 1960 | 1,400 | 5·3 | 771 | 4·6 | 1,247 | 3·6 | 4,744 | 6·5 | 8,162 | 5·4 |
| 1961 | 1,259 | 4·6 | 631 | 3·5 | 964 | 2·8 | 2,794 | 3·9 | 5,648 | 3·7 |
| 1962 | 1,263 | 3·7 | 468 | 2·7 | 809 | 2·3 | 2,315 | 3·5 | 4,857 | 3·2 |
| 1963 | 1,322 | 3·7 | 502 | 3·0 | 836 | 2·3 | 2,466 | 3·9 | 5,129 | 3·4 |
| 1964 | 1,722 | 4·4 | 535 | 3·2 | 945 | 2·5 | 3,599 | 5·5 | 6,801 | 4·3 |
| 1965 | 1,495 | 2·7 | 846 | 4·2 | 1,035 | 2·1 | 3,753 | 5·0 | 7,129 | 3·6 |
| 1966 | 1,056 | 1·6 | 740 | 3·4 | 917 | 1·5 | 4,089 | 4·5 | 6,802 | 2·9 |
| 1967 | 1,018 | 1·4 | 588 | 2·5 | 712 | 1·1 | 1,936 | 2·1 | 4,254 | 1·7 |
| 1968 | 680 | 0·9 | 780 | 3·1 | 794 | 1·1 | 2,696 | 2·6 | 4,950 | 1·8 |
| 1969 | 865 | 1·0 | 710 | 2·3 | 800 | 0·9 | 2,908 | 2·1 | 5,283 | 1·5 |
| 1970 | 526 | 0·5 | 584 | 1·5 | 428 | 0.4 | 1,287 | 0·7 | 2,825 | 0·7 |
| 1971* | 628 | 0·7 | 806 | 1·9 | 446 | 0·4 | 1,676 | 0·8 | 3,556 | 0·8 |

* තාවකාලිකයි.

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව.

3. (අ) පොදු අංශයේ සේවා නියුක්තිය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්ධ-රාජ්‍ය ආයතනවල (රජයේ සංස්ථාවන්, විශ්ව විද්‍යාලයන්, පර්යේෂණ ආයතනයන්, මණ්ඩල යනාදිය) සේවා නියුක්තිය පිළිබඳව 1971 වසරේදී පැවැත්වූ සමීක්ෂණයකට ලැබුණු පිළිතුරු අනුපාතය සතුටුදායක විය. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳවද මෙවැනිම පරීක්ෂණයක් පැවැත්වූවද, එයට ලැබුණු පිළිතුරු සංඛ්‍යාව සතුටුදායක නොවීය. මෙම විමර්ශණයේදී සංඛ්‍යා තොරතුරු ඉදිරිපත් නොකල රජයේ දෙපාර්තමේන්තු පිළිබඳ විස්තර 1970/71 හා 1971/72 යන වසරවල රජයේ ආදායම් සහ වියදම් ඇස්තමේන්තුවල දක්වෙන සේවක සංඛ්‍යා තොරතුරු අනුව ඇස්තමේන්තු කරන ලදී. මෙම සංඛ්‍යා තොරතුරු වලින් අනුමත කළ සේවක සංඛ්‍යාව දක්වුණද ඇතැම් විට රැකියාවල නියුක්ත වූ නියම සංඛ්‍යාව පිළිබිඹු නොවන්නට ඉඩ තිබේ.

ගණ හා සේවා තත්ත්වය අනුව (ස්ථිර, තාවකාලික හා අනියම් වශයෙන්) සේවකයන් වර්ග කොට ඇත. සැළකිල්ලට භාජනය වූ ගණ නම්,

(1) මාණ්ඩලික ශ්‍රෙණියේ පරිපාලන, කාර්මික සහ වෘත්තීය නිලධාරීන්;

(ii) සහායක සේවකයින්;

(iii) සුළු සේවකයින්;

(iv) පාසල් ගුරුවරුන් (රජයේ දෙපාර්තමේන්තුවල);

(v) අනෙකුත් සේවකයින්;

(අ) රජයේ දෙපාර්තමේන්තු

1970 සහ 1971 වර්ෂයන් සඳහා රජයේ දෙපාර්තමේන්තුවල සේවා නියුක්තිය පිළිබඳ ඇස්තමේන්තු පහත සඳහන් සටහනින් දක්වේ.

එම සංඛ්‍යා සටහනෙන් දැක්වෙන පරිදි, රජයේ දෙපාර්තමේන්තුවල සේවා නියුක්ති සංඛ්‍යාවට රජයේ පාසල් ගුරුවරුන් පිළිබඳ දත්තයන්ද ඇතුළත් වෙයි. 1971 වර්ෂයේ සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 58 ක්ම සහායක සේවකයන් හා සුළු සේවකයන්ය මුළු ගණනින් සහායක සේවකයෝ සියයට 31 ක් වූ අතර, සුළු සේවකයෝ සියයට 27 ක් වූහ. ඇත්ත වශයෙන්ම විවිධ ගණයන් අතර සේවකයින් බෙදීගියේ 1970 වෙ මෙනි. මුළු එකතුවෙන් සියයට 3 ක් මාණ්ඩලික ශ්‍රෙණියේ නිළධාරීහු වූහ. 1970 හා 1971 යන වර්ෂ දෙකේදීම මුළු එකතුවෙන් සියයට 30 ක් පමණ රජයේ පාසල් ගුරුවරු වූහ.

අනියම් සේවකයින්ගේ ගණන සැළකියයුතු ප්‍රමාණයෙන් වැඩිවීම නිසා, 1970 දී ස්ථිර සේවකයන්ගේ ගණන මුළු සේවක ප්‍රමාණයෙන් සියයට 89·1 ක් වුවද, 1971 වර්ෂයේදී 88·1 දක්වා අඩුවිය නියත සංඛ්‍යා අනුව බලන කල, තාවකාලික සේවක ගණයන්හි නියුක්ත වූ සේවක සංඛ්‍යාව 1970 සියයට 5.6 සිට 1971 සියයට 5.1 දක්වා අඩුවිය. කෙසේවෙතත් 1970 වසරේ සියයට 5.3 ක් වූ අනියම් සේවක සංඛ්‍යාව 1971 වසරේ සියයට 6.8 දක්වා වැඩි විය.

1971 වර්ෂයේදී, රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු සේවකයන්ගේ ගණන සියයට 3·0 කින් වැඩි විය. 1970 වසරට වඩා සියයට 13.4 කින් මාණ්ඩලික ශ්‍රෙණියේ පරිපාලන නිලධාරීන්ගේ ගණනෙහිවූ මෙම වැඩිවීම ඉහළම වැඩිවීම වෙයි. සහායක සේවකයන්ගේ හා පාසැල් ගුරුවරුන්ගේ ගණන පිළිවෙලින් සියයට 7·4 කින් හා සියයට 0·9 කින් වැඩිවිය. එසේවුවද, 1971 වසරේදී සුළු සේවකයන්ගේ ගණනෙහි සියයට 2.6 ක අඩුවීමක් වාර්තා වේ.

## II (එ) 2 වන සංඛ්‍යා සටහන

### සේවා නියුක්ති සංඛ්‍යාව - රජයේ දෙපාර්තමේන්තු*

| | සේවා තත්වය සහ සේවක සංඛ්‍යාව | | | | | | | | 1970 අනුව වෙනසෙහි සියයට ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථිර | | තාවකාලික | | අනියම් | | එකතුව | | |
| | 1970 දෙ. 31 දිනට | 1971 දෙ. 31 දිනට | 1970 දෙ 31 දිනට | 1971 දෙ. 31 දිනට | 1970 දෙ. 31 දිනට | 1971 දෙ. 31 දිනට | 1970 දෙ. 31 දිනට | 1971 දෙ. 31 දිනට | |
| 1. පරිපාලන, ශිල්පීය, වෘත්තීය, මාණ්ඩලික ශ්‍රෙණියේ නිලධාරීන් | 8,783 | 9,898 | 441 | 565 | 5 | 7 | 9,229 | 10,470 | + 13·4 |
| 2. සහාය සේවකයන් .. | 91,852 | 99,054 | 2,142 | 1,699 | 1,480 | 1,791 | 95,474 | 102,544 | + 7·4 |
| 3. සුළු සේවකයන් .. | 59,564 | 52,661 | 14,687 | 13,590 | 14,311 | 19,994 | 88,562 | 86,245 | — 2·6 |
| 4. පාසැල් ගුරුවරුන් . | 96,966 | 97,864 | — | — | — | — | 96,966 | 97,864 | + 0.9 |
| 5. අනෙකුත් .. | 26,023 | 28,944 | 641 | 835 | 922 | 521 | 27,586 | 30,300 | + 9·8 |
| එකතුව .. | 283,188 | 288,421 | 17,911 | 16,689 | 16,718 | 22,313 | 317,817 | 327,423 | + 3·0 |

* මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සංලක්ෂය:

1. (i) ව්‍යවස්ථාදායක නිලධාරීහු සහ රජයේ පරිපාලකයෝ
   (ii) කළමනාකාර, සභාපති සහ අනෙකුත් මාණ්ඩලික ශ්‍රෙණියේ නිලධාරීහු
   (iii) විද්‍යාඥයෝ, කාර්මිකයෝ සහ ඉංජිනේරුවෝ, වෛද්‍යවරු, මහාචාර්යවරු සහ කථිකාචාර්යවරු ගණකාධිකාරිවරු, තක්සේරු කරුවෝ.
2. (i) ලිපිකරු ශ්‍රෙණි.
   (ii) සරප්වරු.
   (iii) ලඝුලේඛකයෝ, යතුරු ලේඛකයෝ, සයිෆර් ක්‍රියා කරවන්නෝ.
   (iv) දුරකථන සේවකයෝ සහ කාර්යාල යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ.
   (v) පරිවර්තකයෝ.
   (vi) ව්‍යාප්ති පරීක්ෂණ සහ විමර්ශන සේවකයෝ.
   (vii) පොලිස් නිලධාරීහු සහ ග්‍රාම සේවකයෝ.
   (viii) ගබඩාකරුවෝ.
3. (i) පණිවුඩකරුවෝ.
   (ii) කාර්යාල කාර්ය සහායකයෝ.
   (iii) උපස්ථායක සහ ඕඩර්ලිවරු.
   (iv) රියදුරු (මෝටර් රථ, ලොරි ආදිය)
   (v) නුපුහුණු කම්කරුවෝ.
   (vi) අර්ධ - පුහුණු කම්කරුවෝ.
   (vii) පුහුණු කම්කරුවෝ.
4. (i) විදුහල්පතිවරු, උපවිදුහල්පතිවරු, මූල්ගුරුවරු සහ සහකාර මූල්ගුරුවරු.
   (ii) පුහුණු, සහතිකලත්, ඉංග්‍රීසි සහතිකලත්, වැනි වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරු.
   (iii) උපාධිධාරී සහ අන්තර් කලා ගුරුවරු.
   (iv) වෘත්තීය සුදුසුකම් නොලත්, අර්ධ කාලීන සහ අනියම් ගුරුවරු සහ ගුරු ශිෂ්‍ය හා ශිෂ්‍ය ගුරුවරු.

(ආ) අර්ධ - රාජ්‍ය ආයතන

අර්ධ - රාජ්‍ය ආයතනවල සේවා නියුක්ති සංඛ්‍යාවේ ඇස්තමේන්තු පහත දැක්වෙන II (එ) 3 වන සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

II (එ) 3 වන සංඛ්‍යා සටහන

සේවා නියුක්ති සංඛ්‍යා - අර්ධ-රාජ්‍ය ආයතන*

| | සේවා තත්වය හා සේවක සංඛ්‍යාව | | | | | | | | 1970 අනුව වෙනසෙහි ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථිර | | තාවකාලික | | අනියම් | | එකතුව | | |
| | 1970 දෙ. 31 දිනට | 1971 දෙ. 31 දිනට | 1970 දෙ. 31 දිනට | 1971 දෙ. 31 දිනට | 1970 දෙ. 31 දිනට | 1971 දෙ. 31 දිනට | 1970 දෙ. 31 දිනට | 1971 දෙ. 31 දිනට | |
| 1. පරිපාලන, ශිල්පීය සහ මාණ්ඩලික ශ්‍රේණියේ වෘත්තිය නිලධාරීන් .. | 6,011 | 6,581 | 281 | 313 | 23 | 14 | 6,315 | 6,908 | + 9·4 |
| 2. සහාය සේවකයින් .. | 30,047 | 33,149 | 765 | 343 | 499 | 392 | 31,311 | 33,884 | + 8·2 |
| 3. සුලු සේවකයින් .. | 83,941 | 93,453 | 9,887 | 10,216 | 28,852 | 16,196 | 122,680 | 119,865 | — 2·3 |
| 4. අනෙකුත් .. | 5,969 | 8,947 | 228 | 640 | 3,712 | 5,624 | 9,909 | 15,211 | +53·5 |
| එකතුව .. | 125,968 | 142,130 | 11,161 | 11.512 | 33,086 | 22,226 | 170,215 | 175,868 | + 3·3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සංලක්ෂය:

1. (i) ව්‍යවස්ථාදායක නිලධාරීහු හා රජයේ පරිපාලකයෝ.
   (ii) කළමනාකාර. සභාපති සහ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීහු.
   (iii) විද්‍යාඥයෝ, කාර්මිකයෝ සහ ඉංජිනේරුවෝ, වෛද්‍යවරු, මහාචාර්යවරු සහ කථිකාචාර්යවරු, ගණකාධිකාරිවරු, තක්සේරුකරුවෝ.
2. (i) ලිපිකරු ශ්‍රේණි.
   (ii) සරප්වරු
   (iii) ලඝු ලේඛකයෝ යතුරු ලේඛකයෝ සහ සයිෆර් ක්‍රියා කරවන්නෝ.
   (iv) දුරකථන සේවකයෝ සහ කාර්යාල යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ.
   (v) පරිවර්තකයෝ.
   (vi) ව්‍යාප්ති පරීක්ෂකයෝ හා විමර්ශන නිලධාරීහු.
   (vii) පොලිස් නිලධාරීහු සහ ග්‍රාම සේවකයෝ.
   (viii) ගබඩා භාරකරුවෝ.
3. (i) පණිවුඩකරුවෝ.
   (ii) කාර්යාල කාර්ය සහායකයෝ.
   (iii) උපස්ථායක හා ඕඩර්ලිවරු
   (iv) රියැදුරු (මෝටර් රථ හා ලොරි ආදිය).
   (v) නුපුහුණු කම්කරුවෝ.
   (vi) අර්ධ පුහුණු කම්කරුවෝ.
   (vii) පුහුණු කම්කරුවෝ.

* පොදු සමායතන, විශ්ව විද්‍යාල, සංයුක්ත මණ්ඩල යනාදිය.

1971 වසරේදී, අර්ධ රාජ්‍ය ආයතනවල රක්ෂා දෙනු ලැබූ අයගේ අනුපාතය අඩුවිය. 1970 හා 1971 යන වර්ෂවල සේවා නියුක්ති සංඛ්‍යාවේ වැඩිවීම පිළිවෙලින් සියයට 8·3 ක් හා සියයට 3.3 ක් විය. වර්ධන අනුපාතයේ මෙම අඩුවීම 'අනෙකුත් සේවකයන්' යන ගණයේ හැර, සෑම ගණයකම කැපී පෙනෙයි. 'මාණ්ඩලික ශ්‍රේණියේ' සහ 'සහායක සේවක' යන ගණ දෙකේ සංඛ්‍යාවන් පිළිවෙලින් සියයට 9·4 කින් හා සියයට 8·2 කින් වැඩිවූ අතර, 1970 වර්ෂය සඳහා ඇති අදළ සංඛ්‍යාවන් වූයේ 10·5 හා 9·7 කි. සුළු සේවකයන් සම්බන්ධයෙන් සියයට 2·3 ක අඩුවීමක් සිදුවුවද, 'අනෙකුත් සේවක' ගණයේ සියයට 53·5 ක වැඩිවීමක් දක්වේ.

1971 වසරේදී, අර්ධ රාජ්‍ය ආයතනවල නියුතු සේවකයන්ගෙන් සියයට 68 ක්ම සුළු සේවක ගණයට වැටුණි. 1970 වර්ෂය සඳහා වූ අනුරූපී සංඛ්‍යාව සියයට 72 කි. 1970 හා 1971 යන වසරවල, පරිපාලන හා සහායක නිලධාරීන් ගේ සමානුපාතයන් දළ වශයෙන් සමාන වූ අතර, අනෙකුත් සේවක ගණයේ සේවකයන්ගේ ප්‍රතිශතයන් පිළිවෙලින් සියයට 5·8 ක් හා සියයට 8.7 ක් විය.

1971 දී, මුළු සේවක සංඛ්‍යාවෙන් ස්ථිර සේවක ගණයන්හි නියුක්ත වූවන් සියයට 81 ක් වූවද, 1970 දී අනුරූපී ප්‍රතිශතය වූයේ 74 ක් පමණකි. 1971 දී මුළු සේවකයන්ගෙන් සියයට 13 ක් පමණ අනියම් සේවකයෝ වූහ. 1970 වර්ෂයේ මේ ගණය සඳහා වූ අනුරූපී ප්‍රතිශතය වූයේ 19 කි. 1970 සහ 1971 වර්ෂවල මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 7 ක ප්‍රමාණයක් තාවකාලික සේවකයෝ වූහ.

4. (අ) සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි වී ඇති සේවකයන්

සේ. අ. අ. යටතේ ලියාපදිංචි වූවන්ගේ අළුත්ම තොරතුරු ඇත්තේ 1970 වර්ෂය සඳහාය. සේ. අ. අ. යටතේ ලියාපදිංචි වූවන් ප්‍රධාන කාර්මික ගණයන් අනුව, වර්ගකොට ඇත. 1967 සිට 1970 දක්වා වූ වර්ෂ සඳහා මෙම සංඛ්‍යා පහත දක්වා ඇත.

II (එ) 4 වන සංඛ්‍යා සටහන

සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි වී ඇති සේවක සංඛ්‍යාව

| කර්මාන්තය | වර්ෂාවසානය වනවිට ලියාපදිංචි වී සිටි සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 1967 | 1968 | 1969 | 1970 |
| 1. අපනයන කෘෂිකර්මය .. | 1,191,585 | 1,246,138 | 1,220,989 | 1,251,339 |
| 2. අනෙකුත් කෘෂිකර්මය .. | 3,734 | 4,743 | 6,415 | 8,140 |
| 3. පතල් සහ කැනීම් .. | 2,903 | 2,968 | 3,351 | 3,424 |
| 4. නිෂ්පාදන කටයුතු .. | 160,839 | 174·187 | 206,194 | 225,914 |
| 5. තැනීම් කටයුතු .. | 18,929 | 24,890 | 19,745 | 22,086 |
| 6. වෙළෙඳ සහ ගමනාගමන .. | 163,574 | 176,502 | 186,733 | 198,476 |
| 7. සේවා කටයුතු .. | 92,458 | 99,452 | 105,794 | 112,875 |
| 8. වර්ග නොකළ* .. | 18,930 | 11,388 | 4,719 | 6,373 |
| එකතුව .. | 1,652,952 | 1,740,268 | 1,753,940 | 1,828,637 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* දෝෂ සහ අත්හැරීම් ඇතුළත්ය.

සංලක්ෂ්‍ය:

1. සේවාවෙන් ඉවත් වූවද තවදුරටත් සේවක අර්ථසාධක අරමුදලේ බැර ශේෂයන් පවත්වාගෙන යනු ලබන සේවකයින්.

2. දනට වෙනත් කිසිදු සවිස්තරාත්මක තොරතුරු නොමැතිකම නිසා, ආයතනයේ ස්වභාවය අනුව එම ආයතනය අයත්වන කර්මාන්තය වර්ග කර ඇත. එහෙත් බොහෝ අවස්ථාවන්හිදී මෙමගින් කර්මාන්තයේ නියම ස්වභාවය නිරූපණය නොවීම නිසා, උපයෝගී නියම ස්වභාවය හෙළිවන්නේ නොවේ. එබැවින් මෙය දළ වර්ග කිරීමක් පමණක් වෙයි.

1970 වර්ෂයේදී ලියාපදිංචි වී සිටි සේවකයන්ගෙන් සියයට 69 ක් කෘෂිකාර්මික කටයුතු වලද, සියයට 12 ක් නිෂ්පාදන කටයුතුවලද, සියයට 11 ක් වෙළෙඳ හා ගමනාගමන කටයුතුවලද, නිරත වූවන් විය. සේවක සංඛ්‍යාව බෙදී ගිය ආකාරය ඉකුත් වර්ෂවලදී මෙන් විය. 1969 වර්ෂය හා සසඳන කළ සේ. අ. අ. යටතේ ලියාපදිංචි වූවන්ගේ මුළු සංඛ්‍යාව, 1970 දී සියයට 4·3 කින් වැඩිවිය. මෙම වැඩිවීම ශ්‍රම බලවේගයේ වැඩිවීමේ ප්‍රමාණයෙන් සියයට 68 ක් විය. 1969 දී වාර්ෂික වැඩිවීමේ අනුපාතය එක්තරා ප්‍රමාණයකින් අඩුවිය. කෙසේවුවද, 1967/70 කාලච්ඡේදය සඳහා සාමාන්‍ය වාර්ෂික වර්ධනය සියයට 3.5 ක් විය. 1970 වසරේදී විශාලතම වැඩිවීම (සියයට 27 කින්) අනෙකුත් කෘෂිකාර්මික කටයුතු වල සිදුවූ අතර, තැනීමේ කටයුතු (සියයට 12 කින්), නිෂ්පාදන කටයුතු (සියයට 10 කින්), සේවා කටයුතු (සියයට 7 කින්) සහ වෙළෙඳාම් හා ගමනාගමන කටයුතු (සියයට 6 කින්) සැළකිය යුතු අයුරින් වැඩිවිය.

1970 වර්ෂාවසානයේ, කර්මාන්තය හා දිස්ත්‍රික්කය අනුව සේ. අ. අ. යටතේ ලියාපදිංචි වූ සේවක සංඛ්‍යා බෙදී ගිය පිළිවෙල 11 (එ) 5 වැනි සංඛ්‍යා සටහනින් දක්වෙයි.

## II (එ) 5 වන සංඛ්‍යා සටහන

### දිස්ත්‍රික්කය හා කර්මාන්තය අනුව, සේ. අ. අ. යටතේ ලියාපදිංචි වූ සේවක සංඛ්‍යාව – 1970

වර්ෂය අවසානයේ සංඛ්‍යා

| කර්මාන්ත \ දිස්ත්‍රික්කය | කොළඹ | කෑගල්ල | මාතර | රත්නපුර | මහනුවර | නුවරඑළිය | කළුතර | යාපනය | පුත්තලම හා හලාවත | කුරුණෑගල | බදුල්ල | ගාල්ල | වවුනියාව | මාතලේ | අනුරාධපුර | හම්බන්තොට | ත්‍රිකුණාමලය | මඩකලපුව | පොළොන්නරුව | මන්නාරම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| I අපනයන කෘෂිකර්මය .. | 27,153 | 101,765 | 101,971 | 179,793 | 262,260 | 153,949 | 75,629 | 257 | 16,568 | 40,266 | 148,001 | 100,218 | – | 42,863 | – | – | 146 | 500 | – | – | 1,251,339 |
| II අනෙකුත් කෘෂිකර්මය .. | 2,071 | 373 | 325 | 429 | 615 | 227 | 30 | 81 | 26 | 303 | 198 | 2,188 | 58 | 158 | 239 | 607 | – | 184 | 19 | 9 | 8,140 |
| III පතල් හා ගල් කැනීම .. | 2,728 | – | – | – | – | – | 57 | – | – | 591 | – | – | – | 48 | – | – | – | – | – | – | 3,424 |
| IV නිෂ්පාදනය .. | 166,693 | 1,299 | 2,675 | 772 | 4,477 | 446 | 7,023 | 3,859 | 14,076 | 10,609 | 1,862 | 6,264 | 123 | 1,646 | 504 | 422 | 588 | 1,149 | 713 | 714 | 225,914 |
| V තැනීම .. | 14,176 | 321 | 132 | 352 | 3,340 | 175 | 333 | 229 | 38 | 463 | 1,250 | 355 | 20 | 193 | 19 | – | 119 | 126 | 443 | 12 | 22,096 |
| VI වෙළෙඳාම හා ගමනාගමනය .. | 122,147 | 4,778 | 2,850 | 4,637 | 12,767 | 6,000 | 5,814 | 5,087 | 3,212 | 7,743 | 7,473 | 2,131 | 802 | 1,829 | 1,845 | 1,135 | 3,035 | 3,040 | 1,628 | 523 | 198,476 |
| VII සේවා .. | 62,327 | 1,783 | 2,534 | 2,302 | 7,420 | 1,265 | 4,101 | 2,343 | 911 | 2,494 | 3,866 | 10,901 | 295 | 1,910 | 1,655 | 686 | 3,278 | 2,197 | 400 | 207 | 112,875 |
| VIII වර්ග නොකළ .. | 3,297 | 51 | 217 | 549 | 465 | 36 | 175 | 898 | 83 | 348 | 158 | 91 | – | – 4 | – | 4 | – | 33 | 14 | – | 6,373 |
| එකතුව .. | 400,592 | 110,370 | 110,704 | 188,834 | 291,344 | 162,998 | 93,162 | 12,754 | 34,864 | 62,817 | 162,808 | 122,148 | 1,298 | 48,651 | 4,262 | 2,854 | 7,166 | 7,229 | 3,217 | 1,465 | 1,828,637 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සංලක්ෂය: (අ) සේ. අ. අ. යටතේ ලියාපදිංචි කළ සේවකයන්ගේ සංඛ්‍යාව හා සම්බන්ධ සංඛ්‍යාවන්ය.

(ආ) සංඛ්‍යා තාවකාලිකයි.

(i) සේවාවෙන් ඉවත්වූ නමුත් තවමත් සේවක අර්ථසාධක අරමුදලෙහි බැර ශේෂයන් ඇති සේවකයන් හා සම්බන්ධ සංඛ්‍යා ඇතුළත්ය.

(ii) අනුමත කළ අර්ථසාධක අරමුදල් ඇති කර්මාන්තයන්හි සේවා නියුක්තිය මේවාට ඇතුළත් නොවේ.

(iii) කර්මාන්තය අනුව වර්ග කිරීමේ පදනම වූයේ, සේවකයාගේ කර්මාන්තයෙහි ස්වභාවයයි. ලබාගතහැකි වෙනත් තොරතුරක් නොමැතිවූ විට ආයතනයෙහි නමින් දක්වුනු පරිදි බොහෝවිට කර්මාන්තයේ නමින් එහි නියම ස්වභාවය හෙළි නොවිය. මේ අනුව බලනකළ මෙය දළ වර්ගීකරණයක් පමණක් වෙයි.

සේ.අ.අ. යටතේ ලියාපදිංචි වූ සේවකයින්ගෙන් සියයට 22 ක් කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කර්මාන්ත වලද, සියයට 16 ක් නුවරද, සියයට 10 ක් රත්නපුරයේද, නුවරඑළියේ හා බදුල්ලේ සියයට 9 බැගින්ද, සියයට 7 ක් ගාල්ලේද, කෑගල්ල හා මාතර දිස්ත්‍රික්කවල සියයට 6 බැගින්ද විය. මේ වසරේ සේවකයන් බෙදී ගිය ආකාරය ඉකුත් වර්ෂවල ස්වරූපයට බොහෝදුරට සමානය. කොළඹ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි වූ සේවක සංඛ්‍යාවෙන් සියයට 42 ක් නිෂ්පාදන කටයුතු වලද, සියයට 31 ක් වෙළෙඳ හා ගමනාගමන කටයුතු වලද, සියයට 16 ක් සේවා කටයුතු වලද නිරත විය. අනෙකුත් දිස්ත්‍රික්කවල සේවකයන්ගෙන් වැඩි දෙනෙක් කෘෂිකාර්මික කටයුතුවල නිරත වූහ. දිස්ත්‍රික්ක බොහොමයකම නිෂ්පාදන, තැනීම්, වෙළෙඳ හා ගමනාගමන සහ සේවා කටයුතු වල නිරතවූ සේවකයන්ගේ සාමාන්‍ය ව්‍යාප්ති ක්‍රමය සමාන අයුරින් විය.

**(ආ) අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් වලට අයත් සේවකයන්**

පෞද්ගලික අංශයේ ලියාපදිංචි වී ඇති සේවකයන්ගේ සංඛ්‍යා ලබා ගැනීමෙහි අනෙක් ප්‍රධාන මූලාශ්‍රය නම්, අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල්ය. (අ.පෞ.අ.අ.) මේ වර්ෂය තුළ, මෙම අරමුදලේ සාමාජික සංඛ්‍යාව හා සාමාජිකයන් සේවයෙහි නියුතු ව්‍යාපාරයෙහි ස්වභාවය පිළිබඳ විස්තරයක් සපයන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මෙම අරමුදල් වලින් ඉල්ලීමක් කෙළේය. ඒ සඳහා සැපයූ පිළිතුරු සංඛ්‍යාව සතුටුදායක විය. එසේ වුවද, සුළු අරමුදල් සෑහෙන ගණනක් පිළිතුරු නොසැපයූ හෙයින්, ඒවායේ ව්‍යාපාර කටයුතු, වර්ග නොකෙරිණි. කම්කරු දෙපාර්තමේන්තුව මගින් සියළුම අරමුදල්වල මුළු එකතුව අප වෙත සපයන ලදී. II (එ) 6 වැනි සංඛ්‍යා සටහනින්, අ.පෞ.අ. අ. යටතේ ලියාපදිංචි වී ඇති සේවක සංඛ්‍යාවේ, කර්මාන්ත අනුව කළ වර්ගීකරණයක් දැක්වේ.

පෞද්ගලික අර්ථසාධක අරමුදල් යටතේ ලියා පදිංචි වී ඇති සේවක සංඛ්‍යාවට ලංකා ගමනාගමන මණ්ඩලය සහ ලංකා විදුලිබල මණ්ඩලය වැනි විශාල රාජ්‍ය සංස්ථාවන්හි හා ආයතනයන්හි සේවකයන්ද අන්තර්ගත වෙයි.

1971 වර්ෂයේ, විශාලතම වැඩිවීම සිදුවී ඇත්තේ සේවා කටයුතුවල (සියයට 13 කින්) හා තැනීම් කටයුතු වල (සියයට 9 කින්) බව එම සංඛ්‍යා සටහනින් පැහැදිලි වේ 1969/71 යන වර්ෂයන් තුළ, අරමුදලේ මුළු සේවක සංඛ්‍යාවේ වාර්ෂික වැඩිවීමේ සාමාන්‍යය සියයට 2 ක් පමණ විය.

### II (එ) 6 වන සංඛ්‍යා සටහන

**පෞද්ගලික අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි වී ඇති සේවක සංඛ්‍යාව**

| | 1969 | 1970 | 1971 |
|---|---|---|---|
| 1. අපනයන කෘෂිකර්මය .. .. | 9,024 | 8,736 | 8,474 |
| 2. අනෙකුත් කෘෂිකර්මය .. .. | — | — | — |
| 3. පතල් හා කැනීම් .. .. | 83 | 84 | 90 |
| 4. නිෂ්පාදනය .. .. | 3,751 | 3,825 | 4,181 |
| 5. තැනීම් .. .. | — | — | — |
| 6. වෙළෙඳාම හා ගමනාගමනය .. .. | 8,877 | 8,842 | 8,824 |
| 7. සේවා කටයුතු .. .. | 56,197 | 63,606 | 72,086 |
| 8. වර්ග නොකළ* .. .. | 29,739 | 24,392 | 18,345‡ |
| එකතුව .. .. | 107,671 | 109,485 | 112,000‡ |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව,
කම්කරු දෙපාර්තමේන්තුව.

* අරමුදලේ වර්ගීකරණයක් අපේක්ෂා කරන සාමාජික සංඛ්‍යාව.

‡ තාවකාලික

## 5. රැකියා සඳහා ලියාපදිංචි වූවන්

ඉකුත් වර්ෂයේ අවසානයේ රැකියා සහ වඩා යහපත් රැකියා අපේක්ෂාවෙන් ලියාපදිංචි වූ 410,920 හා සසඳන කල, 1971 වර්ෂාවසානය වනවිට ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යා 435,224 ක් විය. ඉකුත් වර්ෂයේ කාර්මික හා ලිපිකරු රැකියාවන් අපේක්ෂාවෙන් ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යාව 13,300 කින් පමණ වැඩිවූවද, 1971 දී ඔවුන්ගේ සංඛ්‍යාව 3,014 කින් අඩුවිය. 1971 දී පුහුණු සේවක ගණයේ ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යාව 3,758 වූවද, එම ගණන 1970 සංඛ්‍යාවට වඩා අඩුය. නුපුහුණු රැකියා අපේක්ෂාවෙන් ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යාව 1970 දී සහ 1971 දී පිළිවෙලින් දළ වශයෙන් 39,000 ක් සහ 21,200 ක් විය.

රැකිරක්ෂා කාර්යාලවල ලියාපදිංචිවූවන්ගේ සංඛ්‍යාවල ඉහළයාමෙ අනුපාතය 1970 වර්ෂයේ සියයට 22 සිට 1971 වර්ෂයේ සියයට 6 දක්වා අඩු විය. එසේවූවද, ලියාපදිංචි වූ නුපුහුණු සේවකයන් සියයට 9 කින් වැඩිවිය. මුළු එකතුවෙන්, සියයට 46 ක විශාල ප්‍රමාණයක් නුපුහුණු ගණයට ගැණුනු අතර, පුහුණු සේවක සංඛ්‍යාව, ඉතාම අඩු අනුපාතයක් (සියයට 10 ක) දැක්විය.

### II (එ) 7 වන සංඛ්‍යා සටහන

**දිවයිනේ රැකීරක්ෂා කාර්යාලයන්හි පවත්වා ගෙන එනු ලබන ලේඛනයන්ට අනුව රැකියා සහ වඩා යහපත් රැකියා අපේක්ෂාවෙන් ලියාපදිංචි වූවන්ගේ ගණන**

| | කාලච්ඡේදය අවසානයේ — සංඛ්‍යා තොරතුරු | | | | |
|---|---|---|---|---|---|
| | කාර්මික සහ ලිපිකරු | පුහුණු | අර්ධ පුහුණු | නුපුහුණු | එකතුව |
| 1969 දෙසැම්බර් .. | 85,314 | 31,147 | 86,492 | 137,833 | 341,286 |
| 1970 මාර්තු .. | 88,824 | 33,057 | 91,743 | 147 903 | 361,527 |
| ජූනි .. | 92,597 | 34,018 | 96,619 | 157,051 | 380,285 |
| සැප්තැම්බර් .. | 95,859 | 35,333 | 93,363 | 162,838 | 387,398 |
| දෙසැම්බර් .. | 99,103 | 37,876 | 96,923 | 177,018 | 410,920 |
| 1971 මාර්තු .. | 96,913 | 38,116 | 96,982 | 182,650 | 414,661 |
| ජූනි .. | 96,100 | 38,889 | 94,035 | 181,513 | 410,537 |
| සැප්තැම්බර්* .. | 94,595 | 41,301 | 97,774 | 192,140 | 425,810 |
| දෙසැම්බර්* .. | 96,089 | 41,634 | 99,207 | 198,294 | 435,224 |

* තාවකාලිකයි

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව.

## 6. කම්කරු සම්බන්ධතා

1971 වර්ෂයේදී පෞද්ගලික අංශයේ ඇතිවූ වැඩ වර්ජන සංඛ්‍යාව, එම වැඩ වර්ජන වලට සහභාගි වූ සේවක සංඛ්‍යාව, සහ නැතිවූ මිනිස් දින ගණන පිළිබඳ සංඛ්‍යා 11 (එ) 8 වන සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත.

### II (එ) 8 වන සංඛ්‍යා සටහන

**පෞද්ගලික අංශයේ වෘත්තීන්හි සිදු වූ වැඩ වර්ජන**

| අවුරුද්ද | වැවිලි | | | අනෙකුත් රැකියා | | |
|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | නැතිවූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධවූ සේවක සංඛ්‍යාව | නැතිවූ මිනිස් දින ගණන |
| 1960 .. | 123 | 42,528 | 259,948 | 37 | 4,839 | 15,139 |
| 1961 .. | 90 | 29,223 | 317,866 | 39 | 38,013 | 170,372 |
| 1962 .. | 138 | 42,569 | 193,792 | 550 | 25,730 | 801,882 |
| 1963 .. | 174 | 62,511 | 359,905 | 58 | 21,819 | 479,678 |
| 1964 .. | 201 | 68,009 | 611,060 | 103 | 21,400 | 274,623 |
| 1965 .. | 175 | 70,929 | 482,259 | 55 | 10,085 | 89,952 |
| 1966 .. | 132 | 138,259 | 4,117,264 | 32 | 4,592 | 34,351 |
| 1967 .. | 194 | 74,968 | 414,636 | 36 | 14,883 | 284,709 |
| 1968 .. | 171 | 65,909 | 722,690 | 26 | 11,308 | 165,726 |
| 1959 .. | 146 | 56,861 | 406,150 | 43 | 6,317 | 58,015 |
| 1970* .. | 254 | 125,530 | 1,030,310 | 86 | 23,488 | 281,253 |
| | 125 | 50,847 | 273,531 | 32 | 39,995 | 239,760 |

* තාවකාලිකයි.

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව.

1970 වර්ෂයේ 254 ක් වූ සංඛ්‍යාව හා සසඳන කළ, 1971 වර්ෂයේ වැවිලි කර්මාන්ත අංශයේ සිදුවී ඇති මුළු වැඩ වර්ජන සංඛ්‍යාව 125 ක් විය. එම වැඩ වර්ජනයට සම්බන්ධ වූ සංඛ්‍යාව 1970 දී 125,530 සිට 1971 දී 50,847 දක්වා අඩුවිය. 'අනෙකුත් රක්ෂා' ගණයේ ද 1970 දී සිදුවූ වැඩ වර්ජන ගණන 1971 වර්ෂයේ සිදුවූ වර්ජන ගණනට වඩා අඩුය.

1969 වර්ෂයේ සංඛ්‍යාව හා සසඳන කළ 1970 වර්ෂයේදී මුළු වැඩ වර්ජන සංඛ්‍යාව සියයට 80 කින් වැඩි විය. එහෙත්, 1971 වර්ෂයේදී තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් විය. වැඩ වර්ජන සංඛ්‍යාව 1970 ට වඩා 1971 වර්ෂයේ සියයට 54 කින් අඩු විය. 1971 වර්ෂයේදී, වැවිලි කර්මාන්ත අංශයේ සහ අනෙකුත් රැකියාවල සිදුවූ වැඩ වර්ජන ගණනවූ 157 න් 93 ක්ම සිදුවූයේ අවුරුද්දේ මුල් තුන් මස තුළදීය.

1971 වර්ෂයේ සිදුවූ වැඩ වර්ජන වලදී සාමාන්‍ය වැඩ කරන තත්ත්වයන්ට වඩා අඩු තැනක් වැටුප් ප්‍රශ්න වලට ලැබිණි. මුළු වැඩවර්ජන වලින් සියයට 27 කට පමණ හේතුවූයේ, වඩා යහපත් සේවා තත්ත්වයන් සඳහා ඉදිරිපත් කල ඉල්ලීම් හා කණිෂ්ඨ නිලධාරින් සමග සිදුවූ ආරවුල්ය. එකතුකළ අගයෙහි වැඩ නැවැත්වීම් හේතුකොටගෙන සිදුවූ, ආර්ථික පාඩුව ඇස්තමේන්තු කළ නොහැකි වුවද, 1970 වර්ෂයේ සිදුවූ පාඩුව හා සසඳන කළ නැතිවූ මිනිස් දින ගණනින් නම්, එය එතරම් බරපතල නොවේ. එසේවුවද, හදිසි නීති තත්ත්වය නිසා වැඩවර්ජන සංඛ්‍යාව ඇතැම්විට අඩුවීයයි සැළකිය හැකිමුත්, දිවයින පුරා බල පැවැත්වූ 'ඇඳිරි නීතිය' නිසා ඇතැම් මාසවලදී නැතිවූ මිනිස්-දින ගණන විශාල වූයේ යයි සැලකිය හැකිය.